# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022**

**2025 ජූලි**

**මානවශාස්ත්‍ර පීඨය**

## නාට්‍ය හා රංගකලාව

**(නව නිර්දේශය)**

**සමකාලීන ශ්‍රී ලාංකේය රංගකලාව DMAT 38224**

මෙම ලිඛිත ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සමන්විත වේ.
අවම වශයෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් තෝරාගෙන
ප්‍රශ්න **හතරකට (04)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

### <u>පළමු කොටස</u>

01. දේශීය වශයෙන් නව නාට්‍ය කලාවක් බිහි කිරීමෙහි ලා නූර්ති නාට්‍යකරුවන් විසින් සිදු කළ කාර්යභාරය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 20)

02. "නූතන ශ්‍රී ලාංකේය නාට්‍ය කලාව ආරම්භ වූයේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගෙනි." උක්ත ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න. (ලකුණු 20)

03. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳ සවිස්තරාත්මක සටහන් ලියන්න.
    - (අ) ඊ.එෆ්.සී. ලුඩෝවයික් සහ විශ්වවිද්‍යාල නාට්‍ය කලාව
    - (ආ) හෙන්රි ජයසේන සහ 60 දශකයේ නාට්‍ය කලාව
    - (ඇ) ගාමිණී හත්තොටුවේගම සහ ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය කලාව
    - (ඈ) ධර්මසිරි බණ්ඩාරනායක සහ ශ්‍රී ලංකාවේ පරිවර්තන නාට්‍ය කලාව

    (ලකුණු 10x2=20)

04. 'නූතන යුරෝපීය නාට්‍ය ශානර මගින් දේශීය නාට්‍ය කලාව ලද ආභාෂය' යන මැයින් උචිත අනුමාතෘකා විභේදනය කරමින් පුවත්පතක පළ කිරීමට සුදුසු ලිපියක් සම්පාදනය කරන්න. (ලකුණු 20)

### <u>දෙවන කොටස</u>

05. සුගතපාල ද සිල්වාගේ මැදිහත්වීම නූතන ශ්‍රී ලාංකේය නාට්‍ය නිෂ්පාදන කලාවේ අභිවෘද්ධියට හේතුවූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 20)

06. නාට්‍ය නිෂ්පාදන ක්‍රියාවලියක නිෂ්පාදන කළමනාකරුගේ සහ වේදිකා කළමනාකරුගේ කාර්යභාරය වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

07. (අ) රංගාලෝක උපකරණ සහ ඒවායෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳව සැකෙවින් හඳුන්වා දෙන්න. (ලකුණු 08)

    (ආ) නාට්‍ය නිර්මාණ දෙකක් උදාහරණ වශයෙන් ගෙන රංගාලෝකකරණයේ නිර්මාණාත්මක කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

08. (අ) නාට්‍ය නිර්මාණයක සංගීතය සහ රංගවින්‍යාසය පිළිබඳව සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

    (ආ) සංගීතය සහ රංගවින්‍යාසය අධ්‍යක්ෂවරයාගේ අර්ථකතනයට දක්වන දායකත්වය නාට්‍ය කෘතියක් නිදසුන් ලෙස ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 12)

****************************